යාපනය මහ නගර සභාව

යාපනය දිස්ත්‍රික්කය

-------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

----------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම

-----------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 13 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණ අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2012 අප්‍රේල් 04 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 නොවැම්බර් 07 දින සභාවේ නගරාධිපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

-------

මාගේ වාර්තාවේ දැක්වෙන අදහස් දැක්විම් සහ නිරික්ෂණයන් හේතුකොට ගෙන විගණනයට ඉදිරිපත් කරන ලද 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ යාපනය මහ නගර සභාවේ මූල්‍ය ප්‍රකාශයන් සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ කිරිමට මට නොහැකි විය.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

(අ) වත්කම්, ආදායම් සහ වගකීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයන්හි නිරික්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පහත වගුවෙහි දැක්වේ.

| <u>මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම</u> | <u>වත්කම්</u> | | <u>ආදායම්</u> | | <u>වගකීම්</u> | |
|---|---|---|---|---|---|---|
| | <u>අවස්ථා සංඛ්‍යාව</u> | <u>වටිනාකම</u> | <u>අවස්ථා සංඛ්‍යාව</u> | <u>වටිනාකම</u> | <u>අවස්ථා සංඛ්‍යාව</u> | <u>වටිනාකම</u> |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| අඩුවෙන් දැක්වීම් | 02 | 21,810,183 | 01 | 611,000 | - | - |
| වැඩියෙන් දැක්වීම් | 02 | 245,526 | 01 | 93,236,301 | - | - |
| අත්හැරීම් | - | - | - | - | 01 | 112,499,034 |

(ආ) සභාව වෙත පරිත්‍යාග වශයෙන් ලද වාහන 03 ක් සහ ගබඩා විෂයයන් අගය කර ගිණුම් වල හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 බැංකු ගිණුම්

---------------

සභාව විසින් පවත්වාගෙන යන ලද පහත සඳහන් බැංකු ජංගම ගිණුම් 05 ක 2012.12.31 දිනට විශාල උපයෝජනය නොකළ මුදල් ප්‍රමාණයක් රඳවාගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| බැංකුවේ නම | ජංගම ගිණුම් අංකය | මුදල් පොත අනුව බැංකු ශේෂය |
|---|---|---|
| | | රු. |
| ලංකා බංකුව | 0001093012 | 3,336,281 |
| ලංකා බංකුව | 0001090685 | 2,248,629 |
| ලංකා බංකුව | 0071362436 | 21,728,259 |
| ලංකා බංකුව | 0001093048 | 2,302,830 |
| කොමර්ෂල් බැංකුව | 1060012686 | <u>1,846,590</u> |
| | | 31,462,589 |
| | | ======== |

(ආ) සභාව විසින් වාර්ෂික සැලසුමෙහි වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණු බැවින් වර්ෂය අවසානයට සභාවේ බැංකු ජංගම ගිණුම් වල රු.31,972,098 ක මුදලක් පෙන්නුම් කෙරුණි.

(ඇ) වර්ෂ 10 කට වඩා පැරණි රු.12,642 ක් වූ ආපසු හැරවූ චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

--------------------------------------------

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

-------------------------------------------

2012 වර්ෂය සඳහා විගණන විමසුම් 21 කට පිළිතුරු සපයා නොතිබුණි. විගණන විමසුම් වලට අදාල ගණනය කළහැකි ගනුදෙනු වල වටිනාකම රු.301,197,196 කි.

(ආ) විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම ප්‍රමාද වීම

---------------------------------------------------------

2012 වර්ෂයේදි විගණන විමසුම් 09 කට මාසයක් ප්‍රමාද වි පිළිතුරු සපයා තිබුණි. ඉහත සඳහන් විගණන විමසුම් වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනු වල වටිනාකම රු.1,965,581 ක් විය.

(ඇ) විගණනය සඳහා තොරතුරු නොසැපයීම

----------------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම නිසා එකතුව රු.223,484,408 ක් වූ ගනුදෙනු 17 ක් විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිමට නොහැකි විය.

2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

----------------------------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම් ඉක්ම වූ ආදායම් අතිරික්තය රු.15,988,564 ක් වූ අතර එයට එරෙහිව ඉකුත් වර්ෂය සඳහා ආදායම් ඉක්මවූ පුනරාවර්ථන වියදම් අතිරික්තය රු.39,061,204 ක් විය.

2.2 මූල්‍ය පාලනය

------------------

(අ) ඇස්තමේන්තුගත ආදායම සහ තථ්‍ය ආදායම අතර රු.23,186,183 ක වෙනසක් ද ඇස්තමේන්තුගත වියදම් සහ තථ්‍ය වියදම් අතර රු.459,458 ක වෙනසක් ද නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව පිළිඹිබු විය.

(ආ) මුළු පුනරාවර්තන වියදම වූ රු.418,171,181 න් පෞද්ගලික පඩිනඩි සඳහා වූ වියදම රු.333,276,573 ක් වූ අතර එයින් මුළු පුනරාවර්ථන වියදමෙන් 80% ක් විය. කෙසේ වුවද වැටුප් ප්‍රතිපූර්ණ වශයෙන් පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් රු.250,801,958 ක් පමණක් ලැබී තිබුණු අතර ඉතිරි රු.82,474,615 සභා අරමුදලෙන් වියදම් කර තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

--------------------------------------------------------------------------

නගරාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ පරිදි සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් සහ බදු | 21,200 | 21,684 | 21,396 |
| බදුකුලී | 39,420 | 55,352 | 1,577 |
| බලපත්‍ර ගාස්තු | 9,731 | 12,302 | 2,851 |
| වෙනත් ආදායම් | 407,501 | 365,325 | 97,172 |
| එකතුව | 477,852 | 454,663 | 122,996 |

2.3.2 ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හිඟ ආදායම් රු.27,958,104 ක් අයකර ගැනිම සඳහා කටයුතු කර නොතිබුණි.

විස්තර පහත දැක්වේ.

| ආදායම් වර්ගය | හිඟය |
|---|---|
| | රු. |
| තක්සේරු බදු | 21,396,250 |
| කඩකුලී | 321,734 |
| මස්කඩ කුලී | 26,683 |
| මස්කඩ බදු කුලි | 108,472 |
| වෙළඳපොල බදුකුලි | 1,120,503 |
| බලපත්‍ර ගාස්තු | 2,121,327 |
| වෙළඳ බදු | 2,850,535 |
| වෘත්තික බදු | 12,600 |
| | 27,958,104 |

(ආ) අපවහන වලවල් පවිත්‍ර කිරීමේ සේවාවන් පාර්ශව ගණනාවකට ණය පදනම මත සපයාදී තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුල රු.782,254 ක් වු ගාස්තු අයකර ගැනිමට සභාව අපොහොසත් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ජලගාස්තු රු.2,102,167 ක් හිඟ හිට තිබුණි. මේ සම්බන්ධයෙන් අර්ථවත් පියවර ගෙන නොතිබුණි.

2.3.3 ආදායම් අහිමි වීම්

----------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව විසින් ප්‍රවාහන සේවා සහ කුලියට දීමේ කටයුතු සඳහා ඉන්දිය රජය විසින් පරිත්‍යාග කරන ලද බස් රථ 05 භාවිතා කර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුල සභාව මෙම ප්‍රවාහන සේවාවෙන් රු.522,088 ක් වූ අලාභයක් විඳ තිබුණි.

(ආ) 1999 වර්ෂයේදි සභා බල ප්‍රදේශය තුල වීති ලාම්පු ස්ථාපනය කිරිම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය අනුමැතිය ලබා දි තිබුණි. කෙසේ වුවද, සභාව විසින් වීති ලාම්පු නඩත්තුව සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමාලෝචිත වර්ෂය තුල වීති ලාම්පු නඩත්තුව වෙනුවෙන් දරන ලද රු.1,599,750 ක් වූ වියදම ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

(ඇ) වීරසිංහම් ශාලාව අසල සභාවට අයත් ඉඩමක පෞද්ගලික බස් රථ ගාල් කිරිමට සභාව ඉඩදී තිබුණි. කෙසේ වුවද සභාව වාහන ගාල් කිරිමේ ගාස්තු අයකර නොතිබුණි.

(ඈ) යාපනය නගර සීමාව තුල ඉදිකරන ලද තාවකාලික කඩවලින් දෛනික බදු අයකිරිමට සභාව අපොහොසත් වි තිබුණි. මේ නිසා සභාවට සැළකිය යුතු ආදායමක් අහිමි වී තිබුණි.

2.4 අධිභාර

------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ

(අ) සේවක අර්ථසාධක අරමුදලට 8% ක සේවක දායකය සභාව විසින් අඩුකරගෙන නොතිබුණු අතර රු.64,914 ක් සභා අරමුදලෙන් ගෙවා තිබුණි. ප්‍රේෂණය කිරිම ප්‍රමාද විම වෙනුවෙන් රු.65,996 ක් වූ අධිභාරයක් ද ගෙවා තිබුණි.

(ආ) ආදායම් ඉපිදවිමේ අරමුණෙන් සභාව බයිසිකල් නැවතුම් පොළක් පවත්වාගෙන ගොස් තිබුණි. කෙසේ වුවද බයිසිකල් නැවතුම් පොළ භාරකරුගෙන් අධිභාර වශයෙන් අයකළ යුතු බයිසිකලයක වටිනාකම වූ රු.11,900 ක මුදලක් සභා අරමුදලෙන් වැය කිරිමට සිදු වි තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුල විදුලි බිල්පත් ගෙවීම ප්‍රමාද වීම වෙනුවෙන් සහා අරමුදලෙන් අධිභාර ලෙස රු.72,211 ක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) රු.11,894 ක් වූ අනුමත නොකළ අන්තර්ජාතික දුරකථන ගාස්තු වගකිවයුතු පුද්ගලයාගෙන් අධිභාර කිරිමට තිබුණි.

(ඉ) ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට පටහැනිව වාහන කුලියට ගැනිම වෙනුවෙන් රු.611,000 ක් වූ කුලී ගාස්තු ගෙවා තිබුණි.

2.5 වත්කම් කළමනාකරණය

---------------------------------

2.5.1 නිෂ්ක්‍රීය සහ ඌණ උපයෝජිත භෞතික සම්පත්

---------------------------------------------------------

(අ) සභාවේ ට්‍රැක්ටර් 11 ක් සමාලෝචිත වර්ෂය තුල ධාවන තත්ත්වයේ නොතිබුණි.

(ආ) සභාව පාවිච්චි කළ වාහන 02 ක සැතපුම් මාපක අළුත්වැඩියා කරමින් පැවතුණි.

(ඇ) සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහා කොමසාරිස් කාර්යාලය විසින් දෙන ලද සබන්, රෙදි සෝදන කුඩු, දත් බෙහෙත් ආදිය ඇතුලත් සැලකිය යුතු විෂයයන් ගණනාවක තොගයක් සභාවේ සෞඛ්‍ය නිලධාරි විසින් බෙදා හැර නොතිබුණි.

(ඈ) මිළදි ගත් හෝ පරිත්‍යාග වශයෙන් ලද විෂයයන් 340 කට අධික තොගයක් අපේක්ෂිත කාර්යයන් සඳහා යොදවා නොගෙන වර්ෂ කිහිපයක් ගබඩාවේ රඳවා තබාගෙන තිබුණි.

2.5.2 අත්තිකාරම් ගිණුම්

------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 371 අනුව අපේක්ෂිත කාර්යයන් සම්පුර්ණ කළ වහාම අත්තිකාරම් පියවිය යුතු වුවද සභාව විසින් නිලධාරියෙකුට ගෙවන ලද රු.9,122,352 ක් වූ අත්තිකාරම්, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පියවා නොතිබුණි.

(ආ) මුලා ප්‍රකාශයන් දැක්වුණු රු.5,438,085 ක් වූ නොපියවූ අත්තිකාරම් තුල 1995 වර්ෂයට පෙර දෙන ලද රු.2,271,448 ක අත්තිකාරමක් ඇතුලත් වූ අතර අත්තිකාරම ලියා හැරීම සඳහා ආණ්ඩුකාරවරයා වෙත ලිපියක් ඉදිරිපත් කර තිබුණි. වර්ෂ 05 කට අධික කාලයක් පැවති රු.3,166,637 ක් වූ නොපියවූ අත්තිකාරම් සම්බන්ධයෙන් ද කටයුතු කර නොතිබුණි.

(ඇ) පෙරියකඩෙයි සුපිරි වෙළඳ පොළෙහි බදුකරුවන්ගෙන් අයකරනු ලබන ගාස්තු වලින් 75% ක මාසික දීමනාවක් ගෙවීම මත සුපිරි වෙළඳ සැලෙහි වැසිකිලි සහ සෞඛ්‍ය පවිත්‍රතා කටයුතු සඳහා ක්ලීන්වෙල් පුද්ගලික සමාගම සමග ගිවිසුමකට එළඹ තිබුණි. කෙසේ වුවද 2010 වර්ෂයේදි අත්තිකාරම් ලෙස සභා අරමුදලෙන් අත්තිකාරම් වශයෙන් රු.1,125,000 ක මුදලක් ගෙවා තිබුණු අතර මෙම වාර්තාවේ දිනය දක්වා බදුකරුවන්ගෙන් මෙම මුදල අයකරගෙන නොතිබුණි.

(ඈ) වර්ෂ 05 කට වඩා පැරණි රු.122,680 ක් වටිනා ආපසු හරවා එවූ චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණු අතර එය අවසන් ගිණුම් වල අඛණ්ඩවම අත්තිකාරම් ලෙස දක්වා තිබුණි.

2.5.3 අයකරගත යුතු කාර්ය මණ්ඩල ණය

---------------------------------------------

විශ්‍රාමික නිලධාරින්ගේ වර්ෂ 05 කට අධික කාලයක් හිඟ හිටි රු.648,086 ක් වූ ණය ඇපකරුවන්ගෙන් සහ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනිමට එලදායි පියවර ගෙන නොතිබුණි. කෙසේ වුවද මෙම හිඟ ශේෂයන් දිගින් දිගටම අවසාන ගිණුම් වල දක්වා තිබුණි.

2.6 නීති, රිති, රෙගුලාසි වලට අනුකූල නොවීම්

---------------------------------------------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්හි විධිවිධානයන්ට අනුකූල නොවීම් විගණනයේදි නිරික්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) 1987 මහනගර සභා පණත | | |
| (i.) 252 පරිච්ඡේදයේ 42(1) වගන්තිය | - | සභාවට අයත් තාවකාලික කඩ 17 ක් පෞද්ගලික පාර්ශවයන් විසින් ස්ථිර කඩ බවට පත්කර |

| | | | |
|---|---|---|---|
| | | | තිබුණි. නමුත් අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් සභාව කිසිදු පියවරක් ගෙන නොතිබුණි. |
| | (ii.) 252 පරිච්ඡේදයේ 188(1) වගන්තිය | - | සභාවේ අරමුණු වලට පටහැනි ගනුදෙනු 04 ක් සඳහා සභාව රු.227,404 ක මුදලක් ගෙවා තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 10(4) වගන්තිය | - | කුලී වාහන භාවිතය සඳහා සභාව රු.611,000 ක් වූ වාහන කුලී ගෙවා තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| | (i.) මුදල් රෙගුලාසි අංක 234 | - | මාස 06 කට අධික කාලයක් උපලබ්ධි වී නොතිබුණු රු.108,608 ක් වූ චෙක්පත් 18 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණු අතර එම අගය විවිධ තැන්පතු ගිණුමෙහි ඇතුලත් කර තිබුණි. |
| | (ii.) මුදල් රෙගුලාසි අංක 571 | - | වර්ෂ 02 ක් ඉක්ම වූ තැන්පතු රු.2,829,698 ක් ආදායමට මාරු නොකොට විවිධ තැන්පතු ගිණුමෙහි ඇතුලත් කර තිබුණි. |
| | (iii.) මුදල් රෙගුලාසි අංක 849(2) | - | රු.11,894 ක් වූ අන්තර්ජාතික දුරකථන ගාස්තු සභා අරමුදලෙන් ගෙවා තිබුණි. |
| (ඈ) | උතුරු පළාත් මුදල් රීති අංක 101 සහ 102 | - | සභාව විසින් අභ්‍යන්තර විගණන වැඩසටහන සහ ත්‍රෛමාසික අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

-

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2006 අංක 10 දරන දේශිය ආදායම් පණත | | 2011 වර්ෂයේදි අයකරගත් රු.11,960 ක් වු රැඳවුම් බදු දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඊ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පණත | - | සමාලෝචිත වර්ෂය තුල අයකරගත් රු.12,077 ක් වු එකතු කළ අගය මත බදු දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (උ) | 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගිමේ බදු පණත | - | සමාලෝචිත වර්ෂය තුල අයකරගත් රු.2,013 ක් වු ජාතිය ගොඩනැගිමේ බදු දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඌ) | අංක 12/2000(iv) සහ 2012 ජනවාරි 20 දින දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | සමාලෝචිත වර්ෂය සඳහා කාර්මික විද්‍යාලයේ පුහුණුවන්නන්ගේ දීමනා රු.163,450 ක් අඩුවෙන් දක්වා තිබුණි. |
| (එ) | අංක 22/999(X) සහ 2007 අගෝස්තු 08 දින දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | මහ නගර සභා නගරාධිපතිවරයාට අනුයුක්ත කරන ලද අංක 59-7103 දරන වාහනය නිවස සිට කාර්යාලය අතර ගමන් කිරිම සඳහා සභාවේ ලේකම් විසින් යොදවා ගෙන තිබුණි. |

2.7 ආර්ථික නොවු ගනුදෙනු

-------------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 3.1 වගන්තිය ප්‍රකාරව රාජකාරි ගමන් අවම පිරිවැයකින් සිදුකළ යුතුය. නමුත් යාපනය සිට කොළඹ දක්වා ගමන් කිරිමට නගරාධිපතිවරයාට රු.14,900 ක් වු ගුවන් ගමන් ගාස්තු ගෙවා තිබුණි.

(ආ) නගරාධිපතිවරයා විසින් මිළදි ගෙන පාවිච්චි කරනු ලබන "සැම්සුන් ගැලක්සි S11" වර්ගයේ ජංගම දුරකථන 03 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදි සභාවේ අරමුදලෙන් රු.99,900 ක මුදලක් ගෙවා තිබුණි. කොමසාරිස්වරයා විසින් මිලදි ගෙන පාවිච්චි කරනු ලබන නොකියා ජංගම දුරකථනය සඳහා රු.10,050 ක් ගෙවා තිබුණි.

(ඇ) ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 10( අ) වගන්තියේ විධිවිධානයන්ට පටහැනිව දිනකට රු.3,250 බැගින් දින 188 ක් සඳහා වාහන කුලී ගාස්තු වශයෙන් සභාව එකතුව රු.611,000 ක් වූ මුදලක් ගෙවා තිබුණි.

2.8 අවිධිමත් ගනුදෙනු

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබා නොගෙන යාපනයේ මහ නගර සභා බල ප්‍රදේශයේ මුනිස්වරන් පාරේ තාවකාලික කඩ කාමරයට විදුලිබල සම්බන්ධතාවය සැපයීම පිණිස රු.16,750 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) සේවකයින්ට සහ මන්ත්‍රීවරුන්ට ජංගම දුරකථන සම්බන්ධතා ලබා දීමට රු.200,000 ක් ද මාසික දුරකථන බිල්පත් සඳහා රු.154,202 ක් ද සභාවේ අරමුදලෙන් ගෙවා තිබුණි.

(ඇ) පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබා නොගෙන 2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය සඳහා නගරාධිපතිවරයා විසින් භාවිතා කළ දුරකථනයේ ගාස්තු ලෙස රු.197,481 ක මුදලක් ගෙවා තිබුණි.

2.9 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------------

2.9.1 සභා අරමුදල් යටතේ ප්‍රාග්ධන වැඩ

---------------------------------------------

සභාවේ අයවැය ලේඛනය අනුව මාර්ග වැඩ, ජලාපවහන වැඩ සහ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සභා අරමුදලෙන් රු.19,700,000 ක මුදලක් වෙන්කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේ වැඩ සැලසුම් අනුව එම වියදම් සඳහා රු.26,744,000 ක් වෙන් කර තිබුණු බැවින් අයවැය ලේඛනය සහ වැඩ සැලසුම් අතර රු.7,044,000 ක වෙනසක් දැක්වුණි. විස්තර පහත දැක්වේ.

| කාර්යය | අයවැය ලේඛනය අනුව වෙන්කළ මුදල | වැඩ සැලසුම අනුව වෙන්කළ මුදල | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු |
| මාර්ග වැඩ | 11,000,000 | 13,063,000 | 2,063,000 |
| ජලාපවහන වැඩ | 5,700,000 | 9,118,000 | 3,418,000 |
| ගොඩනැගිලි ඉදිකිරිම | 3,000,000 | 4,563,000 | 1,563,000 |
| | 19,700,000 | 26,744,000 | 7,044,000 |

2.9.2 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ ප්‍රමාදය

(අ) සභා අරමුදල් යටතේ රු.2,107,000 ක් වටිනා ව්‍යාපෘති 05 ක්‍රියාත්මක කිරිමේ සැලකිය යුතු ප්‍රමාදයන් නිරික්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| ව්‍යාපෘති විස්තර | වෙන්කළ මුදල |
|---|---|
| | රු. |
| බස් නැවතුම් පොළෙහි A කඩ කාමර ගොඩනැගිල්ල ඉදිකිරිම | 131,000 |
| ආරියකුලම් ජලාපවහන තාප්පය | 659,000 |
| වන්කිලියන් වීදියේ ඇල මාර්ගය | 1,000,000 |
| පළමුවැනි හරස්වීදියේ ජලාපවහන කාණු අළුත්වැඩියාව | 200,000 |
| සිවලින්පුලියාඩි 2 වැනි මාවතේ වැඩ | 117,000 |
| | 2,107,000 |

(ආ) වර්ෂ 05 කට පෙර ප්‍රාග්ධන වැඩ 05 ක් සඳහා වෙන් කරන ලද රු.7,001,915 ක් වු අරමුදල් 2010 වර්ෂයේදි ප්‍රාග්ධන වැඩ 05 ක් සඳහා වෙන් කරන ලද රු.568,544 ක් වු අරමුදල් සහ 2011 වර්ෂය

තුලදී ප්‍රාග්ධන වැඩ 02 ක් සඳහා වෙන් කරන ලද රු.1,434,908 ක් වූ අරමුදල්, අපේක්ෂිත කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| කාර්යය | මුදල<br>රු. |
| --- | --- |
| 2010 වර්ෂය සඳහා වැඩ සැලසුම් | |
| යාපනය මහනගර සභාවේ රථ ගාල ව්‍යාප්ත කිරිම | 114,093 |
| ෂෙන්කුන්තා සාප්පු සංකීර්ණයේ 11 ගොඩනැගිල්ල පුනරුත්ථාපනය | 4,679,177 |
| පැති අපවහන පද්ධතිය පුනරුත්ථාපනය | 800,000 |
| රත්නම් මාවත අළුත්වැඩියාව | 470,000 |
| බණ්ඩාරවෙල උප ගබඩාව | 938,645 |
| | --------------- |
| | 7,001,915 |
| | ========= |
| 2011 වර්ෂය සඳහා වැඩ සැලසුම් | |
| කුරුනගර් ටැංකි බිත්තිය ඉදිකිරිම | 146,901 |
| පන්නායි බහාළුම් භූමිය මැණීම | 75,147 |
| වෙරළබඩ ඇල මාර්ග වැඩ | 159,012 |
| පාඩයුර් එළවළු වෙළඳපොළ වැඩිදියුණු කිරිම | 80,000 |
| යාපනය මින්සර වීදියේ ජංගම වැසිකිළිය ඉදිකිරිම | 107,484 |
| | ---------------- |
| | 568,544 |
| | ========= |
| 2012 වර්ෂය සඳහා වැඩ සැලසුම් | |
| අන්තෝනියර් පාරේ වෙරළබඩ මාර්ගයේ අපවහන පද්ධතිය අළුත්වැඩියාව | 995,000 |
| පල්ලිය පාරේ අපවහන පද්ධතිය පුනරුත්ථාපනය | 439,908 |
| | ----------------- |
| | 1,434,908 |
| | ========= |

2.9.3 මාර්ග වැඩ සඳහා වූ ඇස්තමේන්තුවල අඩුපාඩු

-------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෙඩ්ඩ් වීදියේ 2 වැනි හරස් වීදියේ වැඩ රු.480,000 කට අගය කර තිබුණු අතර වැඩ නිමකිරීම් සහතිකය අනුව සම්ප්‍රේෂණ කළ වැඩවල වටිනාකම රු.266,566 ක් විය.

(ආ) වෙඩ්ඩ් වීදියේ 2 වැනි හරස්විදියේ වැඩ සඳහා වැඩ දින 120 ක් ඇස්තමේන්තු කර තිබුණු නමුත් වැඩ නිම කිරීම් සහතිකය අනුව දින 08 කින් වැඩ නිම කර තිබුණි.

2.9.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---------------------------------------

හින්දු විද්‍යාල පාර පුනරුත්ථාපනය සඳහා 2012 ජනවාරි 20 දින රු.110,807 ක් ගෙවා තිබුණු නමුත් එම කාර්යයම මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ද ඉටුකර තිබුණි. මේ සම්බන්ධයෙන් විගණනයට කරුණු පැහැදිලි නොකරන ලදි.

2.10 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල විවිධ කාර්යයන් සඳහා ලැබී තිබුණු රු.3,147,424 ක් වූ පරිත්‍යාග අපේක්ෂිත කාර්යයන් සඳහා යොදාගෙන නොතිබුණු අතර විවිධ තැන්පතු ගිණුමෙහි තබාගෙන තිබුණි. එබැවින් සභාවට දෙන ලද ඉහත පරිත්‍යාග තුලින් ප්‍රදේශයේ ජීවත් වන මහජනයාට ප්‍රතිලාභයක් ලැබී නොතිබුණු බව විගණනයේදි නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | පරිත්‍යාගකරු | පරිත්‍යාගයේ අරමුණ | මුදල |
|---|---|---|---|
| | | | රු. |
| 2006 | UNHCR | මාර්ග ඉදිකිරිම | 212,000 |
| 2012 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | සිමෙන්ති වැඩ | 19,930 |
| 2012 | චීන මහකොමසාරිස් | මහජන පුස්තකාලයේ කියවීම් අංශය සැයම් ගැම | 1,000,000 |
| 2012 | මාර්ග සංවර්ධන | අපවහන පද්ධතිය ඉදිකිරිම | 1,826,321 |

| | | | |
|---|---|---|---|
| | අධිකාරිය | | |
| 2012 | සින්නතුරෙයි මහජන පුස්තකාලය | පුස්තකාලයේ කියවීම් අංශය සායම් ගෑම | 60,000 |
| 2012 | චීන මහාකොමසාරිස් | මහජන පුස්තකාලයේ කියවීම් අංශය සායම් ගෑම | 29,173 |
| | | | ------------------ |
| | | | 3,147,424 |
| | | | ========== |

(ආ) රු.54,334,786 ක් වූ මුදලක් වර්ෂ 05 කට අධිකා කාලයක් විවිධ ණයගිම් ගිණුමෙහි රඳවාගෙන තිබුණු අතර මෙම මුදල් මෙම වාර්තාවේ දින දක්වාම ගෙවා නොතිබුණි.

(ඇ) ප්‍රාග්ධන වැඩ සහ වෙනත් ගෙවීම් වෙනුවෙන් සභාව විසින් ගෙවිය යුතු රු.2,944,190 ක් වූ මුදලක් වර්ෂයකට අධික කාලයක් විවිධ ණයහිමි ගිණුමෙහි තබාගෙන තිබුණි.

(ඇ) වැන්දඹු අනත්දරු සේවකයන්ගෙන් අයකරගත් අරමුදල සේවක අර්ථසාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල් සහ අග්‍රහාර දායක මුදල් රු.1,297,857 ක් තැන්පත් ගිණුමක රඳවාගෙන තිබුණු අතර මෙම වාර්තාවේ දින දක්වාම මෙම දායකමුදල් අදාළ ආයතන වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.11 අභ්‍යන්තර විගණනය
---------------------------

සභාව විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන
---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ආදායම් රැස්කිරීම
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) ගිණුම්කරණය
(ඈ) මානව සම්පත් කළමනාකරණය
(ඉ) ප්‍රදාන හා පරිත්‍යාග
(ඊ) වාහන උපයෝජනය
(උ) ටෙන්ඩර් පරිපාටිය
(ඌ) විවිධ තැන්පතු
(එ) අයවැය පාලනය